**CORGI Registered Central Heating Engineer**
**Reliable, friendly. Any work not too small**
කුඩා හෝ මහා පරිමාණයේ හෝ ඕනෑම
සෙන්ට්‍රල් හීටිං කාර්යයක් සඳහා විමසන්න.
දක්ෂ, එමෙන්ම විශ්වාසවන්ත සේවය
***නාමල්*** **Namal - 0 7 9 5 8 7 2 0 9 1 2**

**Domestic Part P & BS7671 Qualified**
**Professional Electrical Engineer**
**All electrical work carried out**
**Testing-Inspecting and Certification of all work**
**All jobs undertaken with guarentee**
ගෘහස්ත සියළු විදුලි කාර්මික කටයුතු සඳහා
ප්‍රවීන විදුලි ඉන්ජිනේරු ශිල්පී සේවය
**Call - රන්ජිත් Ranjith on 07904174241**

**ලිහිණියා LIHINIYA**
**ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල**
**වසර 20 ක අඛණ්ඩ මිත්‍රශීලී සේවය**
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
***ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ***
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
***උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.***
**Tel. 0208 450 9052**
**66 Cricklewood Broadway, London NW2 3EP**

**A double room to let in London**
**10 minute walk to Burnt Oak Tube, inclusive of bills and internet, parking space for 2 cars on driveway. £ 110 per week. Non smokers only. shared bathroom Kitchen and sitting room.**
**Please call - 07944 393018**

## වෙනස

*බාර් එකේදී හමුවී දැන හැඳිනගත් මිනිසුන් දෙදෙන බාර්එක වහන තෙක් ම බිව්වෝය.*

**පළමුවැන්නා :** මෙච්චර පරක්කු වෙලා ගෙදර ගියාම තමුසෙගෙ නෝනා බනින්නෙ නැද්ද?
**දෙවැන්නා :** මම බැඳලා නැහැනේ යාළුවා
**පළමුවැන්නා :** (තරහෙන්) එහෙනම් මොන කෙහෙම්මලටද ඕයි මෙච්චර පරක්කු වෙන කල් ගෙදර නොයන්නෙ?

**වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි**
**සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ**
♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 448270 /432236
♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල
**සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ. දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.**
**TRICO**
**Shipping & Forwarding Ltd**
**555 White Hart Lane**
**London N17 7RP**
**Telephone 0 2 0 8 8 8 8 8 7 8 7**
**Fax 0 2 0 8 8 8 9 5 4 4 5**
**E-Mail : trico@tricoshipping.com**
***නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය***



## අවංක අයැදුම්කරු

**ඒ**ක් තරුණයෙක් රැකියාවකට අයැදුම් පතක් පුරවමින් සිටියේය. එහි අසා තිබූ එක් වගන්ති යක් මෙසේය.

"ඔබ ජීවිතයේ කිසි දිනක පොලිස් අත් අඩංගුවට ගෙන ඇත්ද ? "

තරුණයා එයට පිළිතුර වශයෙන් 'නැත' යනුවෙන් ලිවීය.

ඊළඟ ප්‍රශ්නය වූයේ කලින් ප්‍රශ්නයට 'ඔව්' යනුවෙන් පිළිතුරු දුන් අය වෙනුවෙනි.

" ඒ ඇයි? "

එතැන තරුණයා මෙසේ ලිවීය.

" කවදාවත් මාව අල්ල ගන්නට බැරිවීමයි."

## නීතිඥයො නම් එපා

**හොර** කල්ලියක් රැයේ නීතිඥයෙකුගේ නිවසට කඩා පැන නීතිඥයාට පහර දී මුදල් රැගෙන යාමට තැත්කළේය. නිතිඥයාද වයස්ගත කෙනෙකු නමුත් හොරුන් හා හරි හරියට සටන් කොට උන් පන්නා හැරියේය.

ආපසු යන අතරේ එක හොරෙක් තමා පැහැරගෙන ආ රුපියල් සීය පෙන්නමින් මෙසේ කීය.

" චික් විතරක්..... අච්චර මහන්සියක් අරගෙනත් උදුරගන්න පුළුවන් වුණේ මේ රුපියල් සීය විතරයි...."

" උඹ ඔහොම කියනවා... ඒක නේ මං මුලදිම කිව්වෙ පෙරකදෝරුවෙකුගෙ ගෙට කවදාවත් පනින්න එපා කියලා.... ඒ ගෙට ඇතුල් වෙන කොට මං ළඟ රුපියල් පන්සීයක් තිබුණා... දැන් තියෙන්නෙ රුපියල් දෙසීයයි...."

## හොඳි හැලීම

**බා**ර් එකේ සිට ගෙදර ඒමට ලෑස්ති වන සිරිපාලගේ ඇඟට වේටර් කෙනෙක් ගෙනයන දීසියක තිබූ හොදි වගයක් වැටුණේය. ඔහුගේ මිතුරා ජයන්ත ද එය දුටුවේය.

**සිරිපාල :** මචං... අද ගෙදර ගියාම ගෑනි මාව කයි... මේ එයා අරන් දීපු කමීසෙ....
**ජයන්ත :** හරි උඹ උඩ සාක්කුවෙ රුපියල් සීයක් දාගෙන ගිහිං වයිෆ් ට කියපං දවල් කන කොට කවුද එකෙක් ඇඟට හොදි හැලුවයි, ඒ පාර මිනිහ කමීසෙ ලොන්ඩරියට දාලා අපුල්ල ගන්න කියලා රුපියල් සීයක් දුන්නයි කියලා... ගෑනි ඒක අරන් සද්ද නැතුව ඉඳීවි......

*ගෙදර ගිය පසු.....*

**බිරිඳ:** මොනවද ඕයි මේ කමීසෙ හලාගෙන තියෙන්නෙ...?
**සිරිපාල :** ආ මේ දවල් කද්දි කවුද එකෙක් හොදි හලලා.... කමීසෙ ලොන්ඩරියට දාගන්න කියලා රුපියල් සීයක් දුන්නා....

*බිරිඳ සිරිපාලගේ සාක්කුවට අත දමා මුදල් එළියට ගනී.*

**බිරිඳ:** රුපියල් සීයයි කිව්වට මෙතන රුපියල් දෙසීයක්ම තියනවා නේ....
**සිරිපාල:** අම්මට උඩු.... එහෙනම් මිනිහා හෙටත් හොදි හලන්න බලාගෙන ඇති....

## දෘෂ්ටි කෝණය

**ක**සිප්පු උවදුර ගැන සමීක්ෂණයක් කිරීම සඳහා නිලධාරීන් පිරිසක් කසිප්පු පෙරීම ගැන ප්‍රසිද්ධ ගමකට ගොස් එක් ගෙදරකට ගොඩවූ අතර, එම නිවසේ සිටි ගැමියාගෙන් එක් නිලධාරියෙක් ප්‍රශ්නයක් ඇසීය.

**නිලධාරියා:** මේ පළාතෙ නීති විරෝධි ලෙස මත්පැන් පෙරන බව ප්‍රසිද්ධයි..... ලොකු උන්නැහෙ මේ සමාජ උවදුර දකින්නෙ මොන දෘෂ්ටි කෝනයෙන්ද....? තවත් පැහැදිලිව කිව්වොත්.... ලොකු උන්නැහෙට මේ උවදුර පෙනෙන්නේ කොහොමද...?
**ගැමියා:** මෙන්න මේ තියන ජනේලෙන් තමයි සර්.....!

## නියම ස්ථානය

***අ**යර්ලන්තයේ ඇස් කණ්ණාඩි සාප්පුවක ෂෝ කේස් එකක මේ දැන්වීමඅලවා තිබුණි.*

" ඔබට අවශ්‍ය දේ මෙතැන පෙනෙන්නේ නැත්නම් ඔබ පැමිණ ඇත්තේ හරි ස්ථානයට ය."

Community Legal Service

**ANTONS**
***SOLICITORS***
**Community Legal Service**
**For Quality Services**

We offer a comprehensive range of Legal Services.

| Conveyancing | Immigration |
|---|---|
| ♦ Sale & Purchase | ♦ Asylum cases |
| ♦ Right to buy (Council House) | ♦ Asylum Application |
| ♦ Re-Mortgage | ♦ Judicial Reviews |
| ♦ Assignment of Lease | ♦ Extensions of Visas |
| ♦ New Lease | ♦ Marriage Applications |
| ♦ Licensing Applications | ♦ Work Permits |
| ♦ Contractual Disputes | ♦ Business Visas |


*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

***Contact -*** **Mrs Rani Bulathwela 0 7 8 0 8 1 5 8 3 6 0**
**Rohitha – 0 7 9 5 6 5 4 9 4 4 7 Nihal – 0 7 9 3 0 3 1 0 9 6 7**
**Vajira – 0 7 8 8 7 8 4 0 2 2 7**

**ANTONS SOLICITORS**
**14 Wordsworth House, Wordsworth Parade**
**London N8 0SJ**
Tel. 0208 888 6211 Fax 0208 888 1403
***E-mail :*** **antons.solicitors@btopenworld.com**

*ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත.* ***ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 11 ක චෙක්පතක්*** *Lanka Viththi* ***යනුවෙන් ලියා පහත ලිපිනයට එවන්න.***
**Lanka Viththi, P. O. Box 64678, London NW3 9LS**

## The old lady and the hat
## කාන්තාව සහ හිස්වැස්ම



An old lady was standing at the railing of the cruise ship holding her hat tight so that it would not blow away in the wind.

A gentleman approached her and said, " Pardon me, madam. I do not intend to be forward but did you know that your dress is blowing up in this high wind ? "

" Yes, I know," said the lady. " I need both my hands to hold onto this hat."

"But madam,you must know that you are not wearing any panties and your privates are exposed!" said the gentleman in earnest.

The woman looked down, then back up at the man and replied:

" Sir, anything you see down there is 85 years old. I just bought this hat yesterday !"

**සං**චාරක නැවක එළිමහන් තට්ටුවේ සුළඟින් ගසාගෙන නොයන්නට දැතින් සිය හිස්වැස්ම අල්ලාගෙන මුහුද දෙස බලාගෙන මහළු කාන්තාවක් සිටියා ය.

පිටුපසින් පැමිණි තරුණයෙක් මෙසේ කීවේය. " සමාවෙන්න මෙහෙම කිව්වට. මැඩම් ඔබ දන්නවද ඔබේ ගවුම පිටුපසින් සුළඟට සේරම උඩට ඉස්සිලා බව....... "

" ඔව් මට තේරෙනවා...." ඇය කීවාය. " මට අත් දෙකම ඕන මේ තොප්පිය අල්ලගන්න....... "

" ඒ වුනාට මැඩම් යටට මුකුත් ඇඳලා නැති බව පිටිපස්සෙන් හොඳට එළියට පේනවා..."

මහලු කාන්තාව පිටුපස හැරී බලා යළිත් තරුණයා දෙසට හැරී මෙසේ පිළිතුරු දුන්නාය.

" මහත්තෙයො ඔහේ පිටිපස්සෙන් දැක්ක ඒ සේරම දේ අවුරුදු 85 ක් පරණයි. නමුත් මේ තොප්පිය හරි අළුත්. මම මේක ගත්තෙ ඊයෙ...."